# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | SASA/PRESS/21 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.07.14 |

**මාධ්‍ය නිවේදනයයි**

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය රට තුළ පවත්නා වත්මන් තත්ත්වය පිළිබඳව සමීපව නිරීක්ෂණය කරමින් සිටින අතර, නිර්පාක්ෂික ජනතා අරගලයේ සාධනීය මහජන මතයන්ට සවන් දී නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරගනිමින් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත පිළිගතහැකි කඩිනම් විසඳුමකට එළඹීම අත්‍යවශ්‍ය බව සියලුම පාර්ශවයන් වෙත අවධාරණය කරමු.

ඒ අනුව,

1. මහජන නියෝජිතයන්, නිර්පාක්ෂික ජනතා අරගලයේ අති බහුතර මහජන මතයට ඇහුම්කම් දෙමින් ඊට අදාළ විසඳුම් ව්‍යවස්ථාදායකය තුළින් වහාම ලබා දිය යුතු ය.
2. නීතියේ ආධිපත්‍යය හා සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීම වෙනුවෙන් අරගලයේ යෙදෙන නිර්පාක්ෂික අරගලකරුවන් ද පවත්නා නීතිමය රාමුව තුළ තම ඉල්ලීම් දිනා ගැනීම සඳහා කටයුතු කළ යුතු ය.
3. දැනටමත් ප්‍රකාශ කර ඇති පරිදි පොදු මහජනතාවට අයත් රාජ්‍ය දේපල විධිමත් ලෙස අදාළ භාරයන්ට වහාම පවරා දීම කළ යුතු අතර මින් ඉදිරියට රාජ්‍ය හෝ පෞද්ගලික දේපලවලට හානි කිරීමෙන් වැළකිය යුතු ය.
4. මෙතෙක් අවිහිංසාවාදී ලෙස ප්‍රචණ්ඩත්වයෙන් තොරව පවත්වාගෙන ආ නිර්පාක්ෂික ජනතා අරගලයට විවිධ අගතිගාමී පුද්ගලයින් හා කණ්ඩායම් ද එක් ව ඇති බව පෙනී යන බැවින් ඔවුන්ගේ පෞද්ගලික පටු අරමුණු ඉටු කරගැනීම සඳහා මෙය වේදිකාවක් කරගැනීමට ඉඩ නොතැබිය යුතුය.
5. දේශපාලන අස්ථාවරත්වයක් පැවතියේ වුව ද රට අරාජික තත්ත්වයකට ගමන් කිරීමට ඇති ඉඩකඩ අවුරාලමින් මිලියන 22 කට අධික ශ්‍රී ලාංකේය ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය පවත්නා සීමිත සම්පත් උපයෝගී කරගනිමින් අවම මට්ටමකින් හෝ පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය, සමස්ත රාජ්‍ය නිලධාරීන් සමඟ එක්ව සිදු කරනු ලබන බව ද අවධාරණය කරමු.

නිර්පාක්ෂික ජන අරගලයේ යහ අරමුණු වූ සාමාන්‍ය ජනජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමටත්, පවත්නා ගැටලු සඳහා ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කෙරෙන විසඳුමක් සෙවීමටත් ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ ක්‍රියාකාරී මැදිහත්වීම අඛණ්ඩව ලබා දෙන බව ද කාරුණිකව දන්වමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

පදුල ශ්‍රී රෝහණ ද සිල්වා
ගරු සභාපති

ප්‍රදීප් ලක්ශාන්ත
ගරු ලේකම්


**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** 23 சீ, சமிட் தொடர்மாடி, கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**

දුරකතනය/ தொலைபேசி/**Telephone : 011 5766855** ෆැක්ස්/தொலைநகல்/ **Fax : 011 2058027**
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/**Email : sasa.execo@gmail.com** වෙබ් අඩවිය/இணையத்தளம்/ **Web: www.sasa.lk**